තමන් වෙනුවෙන් දඬයම් නොකළා වූ එම දඬයම සඳහා උදව් නොකළා වූ දඬයමකින් ඉහ්රාම් ඇඳගත් කෙනෙකු අනුභව කිරීම.

අබූ කතාදා අල් අන්සාරි -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා හජ් වන්දනාව ඉටු කරන්නකු ලෙසින් පිටත්ව ගියහ. එතුමා සමග (සහාබාවරුන් වූ) ඔවුහුද පිටත්ව ගියහ. ඔවුන් අතුරින් පිරිසක් හැරී ආහ. -ඔවුන් අතර අබූ කතාදාද විය- එතුමා : අපි මුණ ගැසෙන තෙක් ඔබලා මුහුදු වෙරළේ රැඳී සිටිනු යැයි පැවසූහ. ඒ අනුව ඔවුහු මුහුදු වෙරළේ රැඳී සිටියහ. ඔවුන් ගිය කල්හි අබූ කතාදා තුමා හැර සෙසු සියලු දෙනා ඉහ්රාම් ඇද ගත්හ. එතුමා ඉහ්රාම් ඇද ගත්තේ නැත.ඔවුන් ගමන් ගනිමින් සිටියදී කැළෑ බූරුවකු දුටුවෝය. එවිට අබූ කතාදා එම බූරාව ඔසවා ගෙනැවිත් කපා හැරියහ. එය බූරු දෙනක් විය. පසුව අපද බැස එහි මස් අනුභව කළෙමු. පසුව අපි ඉහ්රාම් ඇදගත් තත්ත්වයේ සිටයදී දඬයම් මස් අපට අනුභව කළ හැකිදැ?යි විමසා සිටියෙමු. එහි මස්වලින් ඉතිරි කොටස අපි රැගෙන ගොස් අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- හමු වී ඒ ගැන එතුමාගෙන් අපි විමසා සිටියෙමු. එවිට එතුමා: “ඔබ අතුරින් කිසිවකු හෝ එය උසුලන මෙන් නියෝග කළෙහිද? එසේ නැතිනම් ඉඟි කළෙහිද?“ යැයි විමසා සිටියහ. ඔවුහු: නැතැයි පිළිතුරු දුන්නෝය. “එසේ නම් එහි මස්වලින් ඉතිරි කොටස නුඹලා අනුභව කරනු“ යැයි පැවසීය. තවත් වාර්තාවක, ඔබ කිසිවකු අතර ඉන් කිසිවක් තිබේදැයි විමසා සිටියහ. එවිට මම එසේ යැයි පිළිතුරු දුන්නෙමි. එවිට මම එතුමාට ගාතක් පිළිගැන්වූයෙමි. එතුමා එයින් අනුභව කළහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා හුදය්බිය්යා ගිවිසුම සිදු වූ වසරේ උම්රා කිරීමේ අපේක්ෂාවෙන් පිටත්ව ගියහ. මදීනාවේ හරම් සීමාව වූ දුල් හුලෙයිෆා නම් ස්ථානයට යන්නට මත්තෙන් එයට කිට්ටුවෙන් සිටියදී තමන් ඉලක්ක කර ගනිමින් මුහුදු වෙරළ ඔස්සේ සතුරු කණ්ඩායමක් පැමිණෙන බවට ආරංචියක් එතුමාට දන්වන ලදී. එවිට එතුමා එයින් වළක්වාලීම සඳහා මුහුදු වෙරළට යන මාර්ගයේ දාතුල් යමීන් නම් ස්ථානයේ රැඳී සිටින මෙන් එතුමාගේ සහගයින් පිරිසකට අණ කළහ. ඔවුන් අතර අබූ කතාදාද විය. එවිට ඔවුහු ඒ දෙසට ගමන් ගත්හ. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා මුණ ගැසීමට නැවත එන අවස්ථාවේ ඔවුන් ඉහ්රාම් ඇදගත්හ. නමුත් අබූ කතාදා තුමා ඉහ්රාම් ඇඳ ගත්තේ නැත. ඔවුන් යන අතරවාරයේ කැළෑ බූරුවකු දකින්නට විය. ඔවුහු දඬයම් කිරීමෙන් වැළකී සිටියහ. අබූ කතාදා එය දුටු විට ඌ ඔසවා ගෙනැවිත් කපා හැරියේය. හේතුව එතුමා ඉහ්රාම් ඇද නොසිටි බැවිනි. පසුව ඔවුහු එහි මස් අනුභව කළෝය. පසුව තමන් ඉහ්රාම් ඇඳගෙන සිටියදී එයින් ඔවුනට අනුභව කිරීමට අවසර ඇත්දැයි යන්න ගැන ඔවුන් අතර සැකයක් මතු විය. පසුව ඔවුන් ඉතිරි මස් ටික ඔසවා ගෙනැවිත් අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලයිහි වසල්ලම්- තුමා හමු වී ඒගැන ඔවුහු එතුමාගෙන් විමසා සිටියෝය. පසුව එතුමා ඔවුන්ගෙන්: ඒ ගැන විස්තර ඇසූහ. ඔවුන් අතුරින් කිසිවකු හෝ ඔහුට අණ කර සිටියේ ද එසේ නැතිනම් යම් කිසි සළකුණක් කරමින් ඒ සඳහා ඔහුට උදව් කර තිබේ දැයි විමසා සිටියහ. ඔවුහු: ඒ කිසිවක් සිදු නොවූ බව පැවසුවෝය. පසුව එය අනුමතය යන්න වටහා ගත් පසු ඔවුන්ගේ සිත් තැන්පත් විය. එතුමා ඉතිරි ටික ඔවුනට අනුභව කරන මෙන් පවසා ඔවුන්ගේ සිත් සෑහීමට

□□□□□□□ □□□□□ □□□□□□□ □□□□□ □□□.

https://sunnah.global/hadeeth/si/show/3099

